**ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් - 2024**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්හි ("සමාගම") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

-

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතු වුවත්, එසේ අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය. | | | |
| (අ) | සමාගම විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත ලබාදී තිබූ ණය මුදලින් 2024 වර්ෂයේදී ලැබී තිබූ රු. මිලියන 1.25 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. | මෙම විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. | කාලපරිච්ඡේදය තුළ මුදලින් සිදුකළ ගනුදෙනු මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ශේෂයෙන් 2024 වර්ෂයේ දී ගෙවන ලද රු.මිලියන 12.8 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි. | -එම- | -එම- |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 ඔක්තෝබර් 15 සිට 2025 ඔක්තෝබර් 15 දක්වා ඛනිජ වැලි කියුබ් 30000 ක් කැණීම් කිරීම සඳහා රු.මිලියන 15 ක් වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ගෙවා බලපත්‍රයක් ලබාගෙන තිබූ අතර 2024 දෙසැම්බර් 31 දිනට ඒ යටතේ ඛනිජ වැලි කියුබ් 3179 ක ප්‍රමාණයක් කැණීම් කර තිබුණි. ඒ අනුව ඛනිජ වැලි කියුබ් 26821 කට අදාළ රු.මිලියන 13.41 ක් බලපත්‍ර ගාස්තුවක් ඉදිරියට කළ ගෙවීම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, එය රු.මිලියන 15.70 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු.මිලියන 2.29 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2024.12.31 දින වන විට ඉදිරියට ගෙවීම රු.මිලියන 2.29 ක මුදල 2025 වර්ෂයේ පූර්ව වර්ෂයේ ලාභයෙන් ගැලපීමට කටයුතු කරන බව දන්වමු. | ඉදිරියට කළ ගෙවීම් වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගැලපීම් කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී බදු සැසඳීමක් ලෙස රු.මිලියන 140.80 ක් පෙර වර්ෂයේ ලාභයෙන් අඩු කර දැක්වීමට අදාල සාක්ෂිද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ බදු පෙර ලාභයට සිදු කරන ලද ගැලපීම් යටතේ පෙර වර්ෂ ගැලපුම් ලෙස ඇතුළත් කරන ලද රු. මිලියන 138.17 ක් සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂිද විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් අදාල ගැලපීම්වල නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු නොවීය. | ආදායම් බදු වෙන් කිරීමේ ගිණුමේ සටහන නිවැරදි වන අතර පෙර වර්ෂ ගැලපීම් ගිණුමට අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කර ඇත. ජනල් වවුචර් සැකසීමේදී වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි සකස් කරනු ලබන ජනල් වවුචර් පරීක්ෂා කර අත්සන් යෙදීම සඳහා ඊට ඉහළ නිලධාරියෙකු නොමැති බැවින්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිගේ (මූල්‍ය) අත්සන පමණක් දැමීමට සිදු විය. ඉදිරියේදී මේ සඳහා අවශ්‍ය ක්‍රමවේදය සකසනු ලැබේ. | ජ'නල් සටහන් සනාථ කිරීමට අදාළ විධිමත් සාක්ෂි ඉදිරිපත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර සාක්ෂි සහිත අගයන් පමණක් ගිණුම් තුළින් ගැලපිය යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉල්මනයිට්, රුටයිල් සහ චුම්බක නොවන බර ඛනිජ (NMT) යන ඛනිජ සඳහා ගෙවා තිබූ රු.මිලියන 2.52 ක රාජ්‍ය භාග වියදම ඉදිරියට කළ ගෙවීම් යටතේ වර්ෂ පහකට අධික කාලයක සිට දක්වා තිබුණද අදාල ශේෂය නිරවුල් කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | භූ විද්‍යා පතල් කැණීම් කාර්යාංශය වෙත වැඩිපුර ගෙවන ලද රාජ්‍ය භාගය (Royalty) නැවත අයකර ගැනීමට අවස්ථා කිහිපයකදී දැනුම් දුන් අතර අදාල නිෂ්පාදන අයිතමයන් විකුණන අවස්ථාවේ දී ගෙවිය යුතු රාජ්‍ය භාගයට මෙම කලින් ගෙවන ලද රාජ්‍ය භාගය හිලව් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වැඩිපුර ගෙවන ලද රාජ්‍යභාගය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2006 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාළ රු. මිලියන 63.71 ක් වූ ලැබිය යුතු එකතු කල අගය මත බදු වටිනාකම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | එකතු කල අගය මත බදු ගිණුමේ ශේෂය දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව සමග පරීක්ෂා කර නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් කරගෙන යනු ලැබේ. | ලැබිය යුතු එකතු කළ අගය මත බදු ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලයට අදාළ රු. මිලියන 11.13 ක රඳවා ගැනීම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු රඳවා ගැනීමේ මුදල් (Retention Money) නිරවුල් කිරිමට කටයුතු කරනු ලැබේ. | රඳවා ගැනීම් ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පුල්මුඩේ යන්ත්‍රාගාර පරිශ්‍රයේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ලෙස 2011 වර්ෂයේ සිට පවතින රු. මිලියන 5.34 ක් හා 2021-2023 කාලයට අදාලව රු. මිලියන 6.06 ක් වූ විවිධ ණය හිමි ශේෂ 68 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල කාර්ය 2012 වර්ෂයේ පමණ සම්පූර්ණ වුවද මාර්ගය ඉදි කිරීමේදී ටෙන්ඩරයේ අපේක්ෂිත ඝණත්වයට වඩා හා අපේක්ෂිත ප්‍රමාණයට වඩා ඉදිකර ඇත. මේ අනුව අදාල ගෙවීම සිදු කිරීම සඳහා එකල නිසි අනුමැතියන් ලබා ගෙන නොතිබූ නිසා එම ගෙවීම් සම්පූර්ණ කිරීම ගැටළු සහගත වී ඇත.<br>අදාල ශේෂයන් සඳහා ශේෂ තහවුරු කර ගැනීමේ ලිපි අදාළ සැපයුම්කරුවන්ට යවන ලදි. එක් සැපයුම්කරුවකු පමණක් පිළිතුරු | අනුමැතිය මත පමණක් ගෙවිය යුතු මුදල් ගෙවිය යුතු අතර ඉතිරි මුදල් තහවුරු කර ගැනීමෙන් පසු නිරවුල් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | එවන ලදි. ඒ අනුව අදාළ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව ගිණුම් වලින් ඉවත් කිරීමට සූදානමින් සිටින අවස්ථාවේදීම එම ලැයිස්තුවේ සිටි එක් සැපයුම්කරුවකුගේ ගෙවීම් කර ඇත. එසේම පසුගිය වසරේ අග භාගයේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් නොපැවැත්වූ බැවින් ඒ පිළිබඳ තීරණයක් ගැනීමට නොහැකි විය. එසේ වුවද මෙම වර්ෂයේදී නැවත වතාවක් ශේෂයන් තහවුරු කර ගැනීමෙන් පසුව කපා හැරීමට කටයුතු කරනු ඇත. | |
| (ඇ) | 2014/2015 තක්සේරු වර්ෂය සඳහා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවීමට තිබූ රු.මිලියන 21.52 ක ආදායම් බද්දට එරෙහිව ඇපෑලක් (Appeal) ඉදිරිපත් කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු.මිලියන 2.10 න් සියයට 50 ක් බදු උපදේශන සමාගම වෙත ගෙවා තිබූ අතර උපදේශන සේවාව අවසන් කර තිබූ තත්ත්වයක් යටතේ ඉතිරි රු.මිලියන 1.05 ක මුදල 2019 වර්ෂයේ සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අභියාචනය සඳහා අප විසින් තැන්පත් කර තිබූ ඇප කර මුදල රු.මි. 5.3 ක් ආපසු ලැබෙන තෙක් KPMG ආයතනය වෙත අදාල ගාස්තු නිදහස් කිරීම ප්‍රමාද කරන ලදී. 2025.08.11 දින මෙම මුදල් ලැබී ඇති බැවින් ඉදිරි අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය සහිතව ගෙවීමට කටයුතු කරනු ලැබේ. | බදු උපදේශන ගාස්තු කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2004 මාර්තු 30 දිනැති අංක පීඊ/ජීඕ/සීඕ/14/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය | | | |
| | (i) අදාළ ලිපිය මගින් එක් අයකුට පැමිණීමේ දීමනාව මසකට රු.500 ක් අනුමත කර තිබියදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත එය රු.3,000 ක් දක්වා වරින්වර වැඩි කර 2024 වර්ෂයේදී ද ප්‍රධාන කාර්යාල සේවකයන් සඳහා රු. මිලියන 3.20 ක්ද, පුල්මුඩේ යන්ත්‍රාගාර සේවකයන් සඳහා රු. මිලියන 14.43 ක් ද භාණ්ඩාගාර අනුමැතිය ලබානොගෙන ගෙවා තිබුණි. | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/0553/601/040 හා 2024.03.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රාජ්‍ය අංශයේ දීමනා වැඩි කල නොහැකි බවට තීරණය කර ඇති බැවින් ගෙවනු ලබන ආහාර දීමනාව සහ පැමිණීමේ දීමනාව වැඩි කිරීම සඳහා කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් මෙම අවස්ථාවේ එකග විය නොහැකි බව අධ්‍යක්ෂ ජනරාල් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ගෙවූ දීමනා ආපසු අයකර ගත යුතුය. |
| | (ii) අදාළ ලිපිය මගින් ආහාර දීමනාව දිනකට රු.35 ක් අනුමත කර තිබියදී භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත දිනකට රු.200 ක් දක්වා වරින් වර වැඩිකර 2024 වර්ෂයේදී ද ප්‍රධාන කාර්යාල සේවකයන් සඳහා රු. මිලියන 4.26 ක්ද පුල්මුඩේ යන්ත්‍රාගාර සේවකයන් සඳහා රු.මිලියන 25.05 ක්ද ආහාර දීමනා ලෙස ගෙවා තිබුණි. | -එම- | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2023 මැයි 16 දිනැති අංක 1/2021 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අලාභ හෝ ලැබිය යුතු දෑ ලියා හැරීමේදී අවශ්‍ය චක්‍රලේඛ විධිවිධාන සපුරා ලීමෙන් සහ විගණන කමිටුවේ නිර්දේශය සහිතව අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවද 2024 වර්ෂයේ දී රු. මිලියන 37.48 ක ලැබිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම ලියාහැරීමේදී එකී අනුමැතිය ලබාගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ එකතු කල අගයමත බදු ලෙස රු.මිලියන 37.48 ක මුදල ලියා හරිනු ලැබුයේ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වැට් විගනණය කිරිමෙන් අනතුරුව සභාපතිගේ අනුමැතියට යටත්ව වේ. කෙසේ නමුදු අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව විගණන කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |
| (ඇ) | 2022 ජනවාරි 14 දිනැති අංක 1/2015(ii) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2024 පෙබරවාරි 28 දිනැති අංක 01/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 11.3 ඡේදය | සභාපතිවරයාගේ රාජකාරි ඉටු කිරීම සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී අතිරේක ඉන්ධන ලබා දීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවද, අදාල අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2022 සැප්තැම්බර් මාසයේ සිට 2024 අගෝස්තු මාසය දක්වා රු. මිලියන 3.85 ක අතිරේක ඉන්ධන පිරිවැයක් සභාපතිවරයා වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි. | 2022 ඔක්තෝබර් මස සිට 2023 මාර්තු මස දක්වා ලබා ගත් අතිරේක ඉන්ධන සඳහා චක්‍රලේඛ ප්‍රකාරව අනුමැතිය ලබා ගෙන ඇත. ඇමුණුම් ඉදිරිපත් කර ඇත.<br>2023 අප්‍රේල් හා මැයි මස අදාළ අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කලද සවිස්තරාත්මක වාර්තා නැවත ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.<br>අනතුරුව 2024 ජනවාරි සිට ජුලි දක්වා අතිරේක ඉන්ධන පාරිභෝජනය පිළිබඳ වාර්තාව අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබුවද එය අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශ සහිතව ඉදිරිපත් කරන ලෙස දන්වා එවීම නිසා ඒ අනුව කටයුතු කළද එම අවස්ථාව වන විට ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයක් ස්ථාපිත නොවී නොතිබු හෙයින් අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය ලබා ගැනීමට නොහැකි විය. | අනුමැතියක් නොමැතිව සීමාව ඉක්මවා ඉන්ධන දීමනා නොගෙවිය යුතු බව සහ එසේ ගෙවීමට කටයුතු කළ පාර්ශවයන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 07 ඡේදය. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සමාගම විසින් පුල්මුඩේ යන්ත්‍රාගාරය සඳහා 2023 හා 2024 වර්ෂවලදී සේවකයන් 114 ක් අනියම් කම්කරුවන් ලෙස බඳවා ගෙන තිබුණි.<br>වර්තමානය වන විට මෙසේ බඳවා ගන්නා ලද අනියම් | අදාල බඳවා ගැනිම සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණද විමර්ශණ කොමිෂන් සභාව වෙත සිදු කරන ලද පැමිණිල්ලක් අනුව ඒ සම්බන්ධයෙන් විමර්ශණයක් සිදුවන බව දන්වා සිටිමි.<br>ආයතනයේ පවතින කම්කරු තනතුරු පුරප්පාඩු 41 ක් සඳහා අදාල අය බඳවා ගැනීමටත් පුල්මුඩේ යන්ත්‍රාගාරයේ අනුමත කාර්යය මණ්ඩලයේ අත්‍යවශ්‍ය | සේවක බඳවා ගැනීම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අනුමැතියකින් තොරව අනියම් සේවකයින් බඳවා ගැනීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් |

| | | |
|---|---|---|
| සේවකයන්ගෙන් 97 දෙනෙකු ආයතනයේ ඇඟිලි සළකුණු යන්ත්‍රයේ සටහන් කර සේවයට වාර්තා කරන අතර සේවකයන් 17 දෙනෙකුට පමණක් ආයතනය වැටුප් ගෙවීම සිදුකරයි. ඒ අනුව අනියම් සේවකයන් 80 දෙනෙකුට වැටුප් නොලබා මාස 12 ක කාලයක සිට යන්ත්‍රාගාර පරිශ්‍රයේ ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීම පිටවීම සටහන් කිරීමට අවස්ථාව ලබාදී තිබුණද එයට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. | නොවන තනතුරු පුරප්පාඩු කිහිපයක්ද හදුනා ගත් අතර, තවත් තනතුරු කිහිපයක් යටපත් කිරීමටත් තීරණය කර ඇති අතර ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතියට අදාල කටයුතු සදහා යොමු කර ඇත. ඒ අනුව, එහිදී ලබා දෙනු ලබන අනුමැතීන් අනුව කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. | පවත්වා ඊට වගකිව යුතු නිලධාරීන්ට විනයානුකූල පියවර ගත යුතුය. තවද, වැටුප් නොලබන පුද්ගලයන් යන්ත්‍රාගාර පරිශ්‍රයට ඇතුළත් වී ඇඟිලි සලකුණු තැබීම සම්බන්ධයෙන් ද පරිපාලනය භාර නිලධාරීන් වගකිව යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 77.06 ක අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. මිලියන 4,050.72 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 4,127.79 ක පිරිහීමක් නිරීක්ෂණය විය. පසුගිය වර්ෂයන් වලදී සමාගමේ ප්‍රධාන නිෂ්පාදනයන්ගේ අලෙවිය ප්‍රමාණවත් පරිදි සිදු කිරීමට කටයුතුකර නොතිබුණද ඉකුත් වර්ෂයේදී අතුරු නිෂ්පාදනයක් වන සර්කන් කන්සන්ට්‍රේට් (Zircon Consentrate) අලෙවියෙන් රු.මිලියන 4,226.94 ක ආදායමක් ලබාගෙන තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන නිෂ්පාදනයන් මෙන්ම අතුරු නිෂ්පාදනයන් ද ප්‍රමාණවත් පරිදි අලෙවි නොකිරීම, සමාලෝචිත වර්ෂයේ ආදායම රු.මිලියන 4,286.43 කින් අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 සැප්තැම්බර් 19 දිනැති අංක අමප/11/2068/553/018/1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සමාගම විසින් රු.මිලියන 500 ක මුදලක් ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සේවකයන් | මේ සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ පැවති රැස්වීමේදී ලබාදුන් උපදෙස් පරිදි කොළඹ වාණිජ මහාධිකරණයේ පැවති අංක CHC/569/17MR දරන නඩුව 2024 වර්ෂය | භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට කටයුතු |

| | | | |
|---|---|---|---|
| | සඳහා විශ්‍රාම වන්දි යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත 2012 වර්ෂයේදී ලබාදී තිබුණි. මෙම මුදල අයකර ගැනීම සඳහා 2017 වර්ෂයේදී සමාගම විසින් රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට එරෙහිව CHC/569/2017/MR කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් පවරා තිබුණද 2018 මැයි 22 දිනැති අමප/18/විවිධ(019) දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව රාජ්‍ය ආයතන අතර ආරවුල් වේ නම් ඒවා විසඳා ගැනීමේ අරමුණින් අනෙකුත් රජයේ ආයතනයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමෙන් වළකින ලෙස නියම කර තිබීම හේතුවෙන් සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව ඈවර කිරීමේ කටයුතු අවසන් කරන තෙක් මෙම නඩුව බහා තැබීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ලබා ගන්නා ලෙස පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අතිරේක ලේකම්වරයාගේ 2024 ඔක්තෝබර් 04 දිනැති අංක MI/RST/09/04/07 (IV) දරන ලිපියෙන් සමාගම වෙත දන්වා තිබුණි. ලංකා පිඟන් කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ප්‍රකාරව රු.මිලියන 387 ක් පමණක් ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ් වෙත ගෙවිය යුතු ලෙස දක්වා තිබුණ අතර එසේ තිබියදී 2022 වර්ෂයේදී මෙම ණය මුදල හා ඊට අදාල පොලිය වූ රු. මිලියන 517.42 ක්, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පොත්වලින් කපා හැරීමට සමාගම කටයුතු කර තිබුණි. | අවසන් වීමට ප්‍රථම බහා තැබීමට කටයුතු කර ඇත.<br>තවද, රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව ඈවර කිරීමේ කටයුතු අප ආයතනයේ පාලනයෙන් තොර වන අතර එය මහා භාණ්ඩාගාරය විසින් සිදුකළ යුතු කාර්යයක් වේ. | කර ලබාදුන් ණය මුදල හා පොලිය අයකර ගත යුතුය. |
| (ආ) | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සමාගමේ කාර්ය මණ්ඩලය වෙත ගෙවීමට යෝජිත නිෂ්පාදන මත වූ දිරි දීමනා ගෙවීමේ ක්‍රමවේදය ප්‍රකාරව මාසික ඉල්මනයිට් නිෂ්පාදනය මත පදනම්ව දිරිදීමනා ගෙවීමට කටයුතු කළ යුතු අතර ඒ යටතේ අවම මාසික ඉල්මනයිට් නිෂ්පාදන මෙ.ටො 2800 ක් විය යුතුය. එසේම දිරි දීමනා ක්‍රමයේ යම් වෙනසක් සිදු වුවහොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙතින් අනුමැතිය ලබා ගත යුතු බව දක්වා තිබුණි. එසේ වුවද 2024 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ සිට 2025 මැයි | 2024 ඔක්තෝබර් මස සිට ඛනිජ වැලි නිෂ්පාදනය කර ගබඩා කිරීමට නොහැකි වී ඇති හෙයින් අදාල මාසයන්හි නිෂ්පාදන දිරි දිමනාව සේවකයින් වෙත නොගෙවීම මත සේවකයින් අතර නොසන්සුන්කාරී තත්ත්වයන් ඇති වූ හෙයින්ද ඔවුන් විසින් සිදු කරන ලද ඉල්ලීම් පිළිබඳව සලකා බලා මේ සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත කරුණු ඉදිරිපත් කරන ලද අතර 2024 ඔක්තෝබර් මස සිට 2025 මාර්තු මස දක්වා කාලය තුල සත්‍ය වශයෙන්ම හිග නිෂ්පාදන,2025 වර්ෂයේ මුළු සත්‍ය නිෂ්පාදනයෙන් අඩු කර ගැනීමට | ලබාදුන් අනුමැතියට පටහැනිව ගෙවන ලද දිරි දීමනාව වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු අතර ඉදිරියේදී මෙවැනි ගෙවීම් නොකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 31 දක්වා සමාගම විසින් මාසික අවම ඉල්මනයිට් නිෂ්පාදන මට්ටමක් ළඟා කර ගැනීමට අපොහොසත් වී ඇති තත්ත්වයකදී උක්ත අනුමැතියට පටහැනිව රු. මිලියන 36.87 ක නිෂ්පාදනය මත වූ දිරි දීමනාවක් ගෙවා තිබුණි. | යටත්ව මාසික නිෂ්පාදන දිරි දීමනාව ගෙවීමට අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති 2025.04.25 දිනැති PED/I/LMS/3/11(iv) දරන ලිපියට අනුව අදාල අනුමැතිය ලබා දී ඇත. | |
| (ඇ) | 2024 වර්ෂය තුළදී රුටයිල් මෙ.ටොන් 1380 ක් සහ සර්කෝන් මෙ.ටොන් 100 ක් සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතින් අපනයන බලපත්‍ර ලබා ගැනීමේදී රාජ්‍යභාගය ලෙස ගැණුම්කරුගෙන් රැස්කර ගත් මුදල ඉක්මවා රු. මිලියන 4.53 ක් සමාගමේ වියදමින් කාර්යාංශය වෙත ගෙවා තිබුණි. | ආයතනයට ගැණුම්කරුවන්ගෙන් විකුණුමට අදාල මුදල ලැබෙනුයේ ගබඩාවෙන් නිකුතු පදනම මත සහ රාජ්‍ය භාගය සහිත (Ex-Works+Royalty) මුදල් ප්‍රමාණයයි. නමුත් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත අප රාජ්‍ය භාගය ගෙවිය යුත්තේ භාණ්ඩ නැවට පටවන තෙක් (FOB) යන පදනමට අදාලව රාජ්‍ය භාගය ගණනය කර එහි මුදල් වටිනාකමයි. තවද අපගේ ගිණුම් වලට මුදල් බැර වීමේදී අපට ලැබෙනුයේ ලංකා බැංකුවේ විනිමය අනුපාතිකයේ ඇ. ඩොලරයක් සඳහා වන ගැණුම් මිලට අදාල වටිනාකම වන අතර අප රාජ්‍ය භාගය ගෙවිය යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය අනුපාතිකයේ ඇ. ඩොලරයක් සඳහා වන විකුණුම් මිලට අදාල වටිනාකමයි . එම හේතුව නිසා ලැබෙන මුදලට සාපේක්ෂව වැඩි වටිනාකමක් සඳහා රාජ්‍ය භාගය ගෙවීමට අප ආයතනයට සිදු වී ඇත. මේ සම්බන්ධයෙන් අප විසින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර ඒ පිළිබඳව වැඩි දුරටත් සාකච්ඡා පැවැත්වේ. | රාජ්‍යභාගය ලෙස ගෙවන සම්පූර්ණ මුදලම ගැනුම්කරුවන් ගෙන් අයකර ගැනීමට වැඩපිළිවෙලක් හඳුන්වා දිය යුතු අතර රැස්කරගත් මුදල ඉක්මවා වැඩිපුර ගෙවන ලද රාජ්‍යභාගය ගැණුම්කරුවන් ගෙන් අයකර ගත යුතුය. |
| (ඇ) | ඛනිජ වැලි සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතියට අවශ්‍ය අමුද්‍රව්‍ය අඛණ්ඩව සැපයීම සඳහා කෝකිලායිහි නව කම්හලක් ස්ථාපිත කිරීමේ අරමුණින් 2013 වර්ෂයේදී රු.මිලියන 2.25 ක මුදලකට හෙක්ටයාර 17.67 ක ඉඩමක්ද යෝජිත යන්ත්‍රාගාරයේ කටයුතු කිරීම සඳහා 2015 වර්ෂයේදී සේවකයන් 117 ක්ද බඳවාගෙන තිබුණි. එසේ වුවද විගණිත දිනය වූ 2025 ජුනි 30 දින දක්වාම එනම්, වසර 10 කට අධික කාලයක් ගතවී තිබියදී යන්ත්‍රාගාරයේ කටයුතු ආරම්භ කර නොතිබුණි. 2024 දෙසැම්බර් 31 දිනට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 43.71 ක වියදමක් දරා තිබුණි. | ආයතනයේ විටින් විට සිදුවූ කළමනාකාරීත්ව වෙනස්වීම් සමඟ කෝකිලායි යන්ත්‍රාගාරය ආරම්භ කිරීම ප්‍රමාද වූ අතර, කෙසේ වෙතත් 2024 වර්ෂයේ මුල් භාගයේදි යන්ත්‍රාගාරයක් ඉදිකිරීමට අදාලව ව්‍යාපෘති වාර්තාවක් සකස්කිරීම සඳහා උපදේශකවරයෙකු බඳවා ගැනිම සඳහා ටෙන්ඩර් කැඳවීම සිදුකරන ලදී. මේ සඳහා උපදේශන ප්‍රසම්පාදන කමිටුවක් පත්කර ටෙන්ඩර් කැඳවීමෙන් පසු ලැබූ ලංසු අදාල කමිටුව වෙත යොමුකර නිර්දේශ ලබාගන්නා ලදී. එසේ වුවද ඉන්පසුව සිදුවූ කළමනාකරණ වෙනස්විමත් සමඟ අදාල කමිටුවේ සාමාජිකයින්ද ඉවත්වන ලදී. අදාල කාර්යය මෙම තත්ත්වය තුල ඇනහිට ඇති අතර නව | අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කර යන්ත්‍රාගාරයේ කටයුතු විධිමත් ලෙස ආරම්භ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | උපදේශන ප්‍රසම්පාදන කමිටුවක් පත්කර එම කාර්යය ඉදිරියට සිදුකල යුතු වේ. එසේ වුවද ආයතනය විසින් ඉදිරියේදී ඉතා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කරමින් ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කරනු ලැබේ. | |
| (ඉ) | 2024 වර්ෂය ආරම්භයේදී මෙ.ටොන් 187,951 ක ඛනිජ වැලි තොගයක් සමාගම සතුව පැවතියද වර්ෂය තුළ මෙ.ටොන් 26,744.1 ක නිෂ්පාදනයක් සිදු කර වර්ෂය තුළදී මෙ.ටොන් 1,490 ක් පමණක් අලෙවි කර තිබුණි. සමාගමේ ඛනිජ වැලි අලෙවිය 2021 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා පිළිවෙලින් මෙ.ටොන් 81137, 64380, 32071 ක් හා 1490 ක් ලෙස දිගින් දිගටම අඩුවන තත්ත්වයක් නිරීක්ෂණය වන අතර අලෙවිය වර්ධනය කර ගැනීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර නොතිබුණි. මේ හේතුවෙන් යන්ත්‍රාගාරයේ ගබඩා ධාරිතාව ඉක්මවා යෑමේ ගැටලුවකට සමාගම මුහුණ දී තිබුණු අතර ඛනිජ වැලි මෙ.ටොන් 15000 ක් මසකට රු. මිලියන 1.5 ක ගාස්තුවක් ගෙවා ත්‍රිකුණාමල වරායේ ගබඩාවේ 2024 මාර්තු මාසයේ සිට ගබඩා කර තිබුණි. | 2021 වසරේ සිට 2024 වර්ෂය දක්වා අඛණ්ඩව විකුණුම් ආදායමේ පැවති අඩු වන ප්‍රවනතාවය විකුණුම් ක්‍රමවේදයේ පැවති දූර්වලතාවය නිසාය. නමුත් වර්තමානයේ මෙම විකුණුම් ක්‍රමවේදය වෙනස් කිරීමට කැබිනට් අනුමැතිය ලැබී ඇති බැවින්ද මේ වසරේ සිට සිදු කරනු ලබන අලෙවි ටෙන්ඩරය සඳහා එම නව ක්‍රමවේදය අනුගමනය කිරීමට කටයුතු කර ඇත. ඒ තුලින් මෙම දුවශීලතා ගැටළුව ඉවත් වනු ඇතැයි අපේක්ෂා කරයි.<br>ඉල්මනයිට් නිෂ්පාදන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ඉල්මනයිට් මෙ.ටො. 15000ක ප්‍රමාණයක් ත්‍රිකුණාමල වරාය සංකීර්ණයේ ගබඩා කිරීමට තීරණය කල අතර, එම ඉල්මනයිට් මෙ.ටො. 15000ක ප්‍රමාණයද අපේක්ෂිත පරිදි අලෙවි කිරීමට නොහැකිවීම හේතුවෙන් එම ත්‍රිකුණාමල වරායේ ගබඩාවට තවදුරටත් මාසිකව ගාස්තු ගෙවීමට සිදුව ඇත. | ඛනිජ වැලි අලෙවිය ප්‍රවර්ධනය සඳහා සමාගම විසින් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර මෙම ගැටලුව කඩිනමින් විසඳාගත යුතු අතර වාර්ෂිකව සිදු කෙරෙන අලෙවිය මත හා ගබඩාවල ධාරිතාවය මත වාර්ෂික නිෂ්පාදනය සීමා කළ යුතුය. |
| (ඊ) | හිටපු සභාපතිවරයා සහ ප්‍රධාන ඉංජිනේරුවරයා (කැණීම් හා සැකසීම්) 2024 අප්‍රේල් 15 දින සිට 2024 අප්‍රේල් 20 දින දක්වා චීනයේ හයිකෝ නගරයේ පැවති "2024 ගෝලීය සර්කෝන් සම්මන්ත්‍රණයට" සහභාගී වී තිබුණි. මේ සඳහා සම්මන්ත්‍රණය සංවිධානය කළ විදේශීය ආයතනය විසින් ලබාදී තිබු මිල රු. මිලියන 2.19 ක් වුවද මේ සඳහා රු.මිලියන 3.2 ක මුදලක් සමාගම විසින් දරා තිබුණි. සභාපතිවරයා 2024 අප්‍රේල් 04 දින කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්වරයා අමතන ලද ලිපිය ප්‍රකාරව විදේශ සංචාරයේ මූලික අරමුණු ලෙස ඉල්මනයිට් නිෂ්පාදනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය 2024 වර්ෂයේ අවසන් කිරීම, නියෝජිතයන්ගෙන් කිසිඳු බාධාවකින් තොරව සමාගමේ විකුණුම් මිල වැඩි කර ගැනීම සහ ගැණුම්කරුවන්ගේ අපේක්ෂාවන් අධ්‍යයනය කර ඊට අවශ්‍ය ගැලපුම් සිදුකර ආයතනයේ ලාභදායීත්වය | මේ සම්බන්ධයෙන් 2025.07.22 දිනැති MI/CIA/04/08/33 දරණ කර්මාන්ත අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කර ඇති විගණන පරික්ෂාව අනුව එහි සඳහන් නිර්දේශ අනුව අවශ්‍ය කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිමි. | විධිමත් පරික්ෂණයක් සිදුකර ආයතනයට සිදුවී ඇති අලාභය වගකිව යුතු පාර්ශවයන් ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

වර්ධනය කර ගැනීම ලෙස දක්වා තිබුණි. එසේ වුවද, කිසිදු විදේශීය නව ගැනුම්කරුවකු සමාගම වෙත හඳුන්වා දුන් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණු අතර 2024 වර්ෂයේ සමාගමේ අලෙවිය අපේක්ෂිත අලෙවියෙන් සියයට 1 ක් පමණක් වී තිබුණි. මෙම සංචාරයට සහභාගී වූ සභාපතිවරයාගේ නිල කාලය 2024 සැප්තැම්බර් මස අවසන් වී තිබූ අතර ප්‍රධාන ඉංජිනේරුවරයා (කැණීම් හා සැකසීම්) 2024 දෙසැම්බර් 19 වන දින සිට සමාගමේ සේවයට වාර්තා කර නොතිබුණි. ඒ අනුව මෙම විදේශ සංචාරය සඳහා දැරූ වියදමෙන් ආයතනය වෙත අපේක්ෂිත ප්‍රතිලාභ කිසිවක් ලැබී නොතිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018- 2028 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළ පුල්මුඩේ, පොඩුවාකට්ටු, තෙවික්කල්ලු යන ප්‍රදේශවල දළ වැලි කැණීම් කිරීම සඳහා සමාගම සතුව වලංගු කැණීම් බලපත්‍ර 03 ක් පැවතියද පුල්මුඩේ කැණීම් බලපත්‍රයෙන් පමණක් 2023 හා 2024 වර්ෂවලදී කැණීම් කිරීමට සමාගම කටයුතු කර තිබුණි. 2024 වර්ෂයේදී දළ වැලි යෙදවුම් තුළ අන්තර්ගත අක්වැලි (tailing) ප්‍රතිශතය සියයට 37 සිට සියයට 64 දක්වා වැඩි මට්ටමක පවතින බව සමාගමේ විද්‍යාගාර වාර්තා අනුව නිරීක්ෂණය වූ අතර දීර්ඝ කාලීනව පුල්මුඩේ වෙරළ තීරය ආශ්‍රිතව දළ වැලි කැණීම් කිරීම හේතුවෙන් එම වෙරළ තීරයේ දළ වැලි තුළ අන්තර්ගත බර ඛනිජ සංයුතිය මෙසේ ක්‍රමයෙන් හීන වෙමින් පැවතිණි. | සමාගමට 2018 සිට 2028 දක්වා වලංගු බලපත්‍ර 03ක් තිබුණද, 2023 සහ 2024 වර්ෂවලදී පුල්මුඩේ කලාපය සඳහා බලපත්‍ර එකක් පමණක් යටතේ කැණීම් කටයුතු සිදු කර තිබුණි. පුල්මුඩේ මුහුදු තීරයේ දිගුකාලීනව ඛණිජ වැලි කැණීම් කටයුතු සිදුකිරීම නිසා එහි අඩංගු බර ඛණිජ වැලි ප්‍රතිශතය අඩුවී ඇත. 2024 වර්ෂය වන විට සමාගමේ රසායනාගාර වාර්තා අනුව, දළ වැලිවල (Raw Sand) අඩංගු අක්වැලි (Tailings) ප්‍රතිශතය වැඩිවී ඇත.<br>**පුල්මුඩේ කලාපයේ** ඛණිජ වැලි කැණීම් කටයුතු සිදුකිරීම සඳහා GSMB ආයතනය මඟින් පනවා ඇති රෙගුලාසි යටතේ කැණීම් සිදුකිරීම ඉතා අපහසු වී ඇත. පොඩ්ඩුවකට්ටු හා තෙවික්කල්ලු ප්‍රදේශවල බර ඛණිජ වැලි ප්‍රතිශතය ඉතා අඩු අගයක පවතී. | ඛනිජ වැලි කැණීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ රෙගුලාසි යටතේ සිදුකළ යුතුය. |
| (ආ) | ඉදිරි වර්ෂ 20 සඳහා කැණීම් සැලැස්මක් ඉදිරිපත් නොකිරීම සහ පවත්නා කැණීම් බලපත්‍ර ඌන උපයෝජන තත්ත්වයේ පැවතීම යන හේතු දක්වමින් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් සමාගම ඉල්ලුම් කළ නව ගවේෂණ බලපත්‍ර අයදුම්පත් 7 ක් 2023 මැයි 25 වන දින ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් සමාලෝචිත | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2023.01.03 දිනැති ලිපියෙන් කාර්යාංශය වෙත අදාළ වර්ෂ 20 ක කැණීම් සැලැස්ම ඉදිරිපත් කිරීම සඳහා මාස 6 ක කාලයක් ලබාදී ඇත.ඒ අනුව අදාල සැලැස්ම 2023.06.29 දිනැතිව ඉදිරිපත් කර ඇත. එහෙත් වාර්තාව ඉදිරිපත් කිරීමට පෙර | කැණීම් බලපත්‍ර ඌන උපයෝජිත තත්ත්වයේ පැවතීම වළක්වා ගත යුතු අතර ඛනිජ නිධි දීර්ඝ කාලීන කැණීම් සඳහා වෙන්කර |

| | | |
|---|---|---|
| වර්ෂය අවසානය වන විටත් කිසිදු ගවේෂණ බලපත්‍රයක් සමාගම සතුව නොපැවතුණි. | 2023.04.26 දින (අදාල වාර්තා ඉදිරිපත් කිරීමට මාසයකටත් වඩා ඉදිරියට කල් තිබියදී කාර්යාංශය විසින්) මෙම නව ගවේෂණ බලපත්‍ර සඳහා වන ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ 2023.01.03 දිනැති ලිපිය අනුව ගවේෂණ කටයුතු අවසන් කර ඇති ප්‍රදේශ වල තවදුරටත් ගවේෂණ බලපත්‍ර දීර්ඝ කිරීම අවශ්‍ය නොවන බව සඳහන්ව ඇත. ඉදිරි වර්ෂ 25 ක කාලය සඳහා වන නව කැණීම් සැලැස්මක් ආයතනයේ ගවේෂණ ප්‍රදේශ ආවරණය වන පරිදි සකස් කර 2025.07.31 දින නැවත භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත භාරදී ඇත. ඒ අනුව අදාළ ඛනිජ නිධි දීර්ඝ කාලීන කැණීම් සඳහා වෙන්කර ගැනීමට කටයුතු කරමින් සිටී. | ගැනීම සිදුකළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය තුළ මානව සම්පත් තොරතුරු පද්ධතියක් (HRIS) ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව 2024 සැප්තැම්බර් 20 දින රු.මිලියන 2.19 කට පුද්ගලික සමාගමක් වෙත පවරා තිබූ අතර ගිවිසුම ප්‍රකාරව මෙම පරිගණක මෘදුකාංගය ස්ථාපිත කිරීම දින 60 ක කාලයක් තුළ සිදුකළ යුතුව පැවතුණි. ඒ අනුව පුල්මුඩේ යන්ත්‍රාගාර පරිශ්‍රයේ පමණක් පරිගණක මෘදුකාංගය ස්ථාපිත කර තිබුණද 2025 ජුනි 30 දින වන විටත් ප්‍රධාන කාර්යාලය තුළ මෙම මෘදුකාංගය ස්ථාපිත කිරීමේ කාර්යය ආරම්භක අදියරේ පැවතුණි. එසේ වුවද 2024 සැප්තැම්බර් 25 වන දින වන විට ගිවිසුම්ගත මුදලින් සියයට 90 ක් හෙවත් රු. මිලියන 1.97 ක් ගෙවා තිබුණි. | මේ වන විට වැටුප් පරිවර්තනයන් නිවැරදි කිරීමට අදාල කටයුතු සිදු කරමින් පවතින අතර අදාල තොරතුරු එම ආයතනයේ මෘදුකාංග සැකසුම්කරු වෙත ලබා දිය යුතුව ඇත.<br>එමෙන්ම ප්‍රධාන කාර්යාලයේ මේ සඳහා පත් කරන ලද නිලධාරියා අවස්ථා කීපයකදීම විවිධ හේතූන් නිසා පුල්මුඩේ යන්ත්‍රාගාරය වෙත ස්ථාන මාරු කිරීමට සිදුවීම මතද ප්‍රධාන කාර්යාලයේ කටයුතු සිදු නොවීමට හේතු වී ඇත. | ප්‍රධාන කාර්යාලය සතු මෘදුකාංගය ස්ථාපිත කිරීමේ කටයුතු අවසන් කර එය භාවිතයට ගැනීම කළ යුතුය. |

## 3.4 නිෂ්කාර්ය වත්කම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නැගෙනහිර වෙරළ තීරයේ පවතින සියයට 30 ට අඩු බර ඛනිජ සහිත ප්‍රදේශවල ඛනිජ වැලි කැණීම් කිරීමේ අරමුණින් 2022 වර්ෂයේදී රු. මිලියන 328.88 කට මිලදී ගෙන තිබුණු ජංගම යන්ත්‍රාගාර දෙකෙන් එක් යන්ත්‍රයක් 2024 වර්ෂයේදී පුල්මුඩේ යන්ත්‍රාගාර පරිශ්‍රයේ ස්ථාපිත කර තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 8.63 ක වියදමක් දරා විදුලි සැපයුම් පද්ධතියක් ද මිලදී ගෙන තිබුණි. එසේ වුවද එම යන්ත්‍රාගාරය 2025 ජුනි 30 දින වන විට නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමකින් තොරව නිශ්කාර්ය වත්කමක් ලෙස පැවතුණි. තවද රු. මිලියන 159.35 ක් වටිනා ඉතිරි ජංගම යන්ත්‍රාගාරය ස්ථාපිත කිරීමකින් ද තොරව එහි කොටස් අනාරක්ෂිත ලෙස පුල්මුඩේ යන්ත්‍රාගාර පරිශ්‍රයේ තැන් තැන් වල දමා තිබුණි. | යන්ත්‍ර සවිකිරීම සඳහා පොඩුවකට්ටු, තෙවික්කල්ලු ප්‍රදේශවල සුදුසු ඉඩම් දෙකක් සොයාගැනීමට උත්සාහ කලද එය දුෂ්කර වීම හේතුවෙන් එක් යන්ත්‍රාගාරයක් පුල්මුඩේ යන්ත්‍රාගාර පරිශ්‍රය තුල ස්ථාපිත කරන ලදී. ඒ අනුව දළ වැලි මෙ.ටොන් 4134 ක් පමණ feed කර සාන්ද්‍රගත ඛණිජ වැලි මෙ.ටො. 852ක් පමණ 2023 නොවැම්බර් මස සිට 2024 නොවැම්බර් මාසය දක්වා කාලය තුලදී ලබාගන්නා ලදී. එමෙන්ම පසුව ඉතිරි යන්ත්‍රාගාරය පොඩුවකට්ටු ප්‍රදේශයේ ස්ථාපිත කිරීම සඳහා සුදුසු භූමියක් කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් විසින් අප ආයතනය වෙත ලබාදෙන ලදී. එනමුත් එම ප්‍රදේශයේ පුද්ගලයෙකු විසින් එම ඉඩම ඔහුට හිමි බව පවසා අධිකරණ කටයුත්තකට යොමුවූ බැවින් එම ක්‍රියාවලියද තාවකාලිකව නවතා දමන ලදී. | යන්ත්‍ර ස්ථාපිත කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදු නොකර යන්ත්‍ර මිලදී ගෙන නිෂ්කාර්යව හා කොටස් අනාරක්ෂිතව තැනින් තැන දමා තිබීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සර්කෝන් යන්ත්‍රාගාරයේ ඉන්ධන දහනය වන ප්‍රමාණය සියයට 50 කින් අඩුකර ගැනීමේ අරමුණින් වියළන යන්ත්‍රයක් 2016 ජුනි 30 වන දින රු. මිලියන 45.12 කට මිලදී ගෙන තිබුණු අතර එම යන්ත්‍රය ක්‍රියාකාරි තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය නවීකරණයන් සිදුකිරීම සඳහා 2024 වර්ෂයේදී රු.954,000 ක මුදලක් වැය කර තිබුණි. එසේ වුවද යන්ත්‍රය ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට සමාගම අපොහොසත් වී තිබුණ අතර ඒ අනුව රු.මිලියන 46.07 නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි. | වියළන යන්ත්‍රය මිලදි ගැනීමෙන් පසු භාවිතා කිරීමේ තත්ත්වයට පත්කිරීමට දේශිය නියෝජිතයා අපොහොසත්වූ අතර ඇතිවූ ගැටළුව විසඳීමට විශාල වෙහෙසක් ගන්නා ලදී. නමුත් පසුව ඔවුන් විශාල මුදලක් ඉල්ලා සිටින ලදී. එම මුදල ගෙවීමට ආයතනය අනුමත නොකිරීම නිසා ඔහු විසින් එම කටයුත්තෙන් ඉවත්විය. මෙම තත්වය මත දේශිය සමාගමක සහාය ගැනීමට තීරණය විය.<br>පසුව දේශීය ආයතන දෙකකට මුදල් ගෙවා ක්‍රියාත්මක තත්වයට ගෙන ඒමට විශාල උත්සාහයක් ගත් අතර තාක්ෂණික ගැටළු නිවැරදි කිරීමට ඔවුනට නොහැකිවීම නිසා අතර මග නවතා දමන ලදී. | මෙම යන්ත්‍රය මිලදී ගැනීමට කටයුතු කළ වගකිව යුත්තන් හඳුනාගෙන සිදුකර ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේ දී රු.මිලියන 7.82 කට මිලදී ගත් මුහුදු ජල පොම්පාගාරය සඳහා වූ මෝටරය සඳහා 2024 වර්ෂයේ දෙසැම්බර් දක්වා රු. මිලියන 13.36 ක අමතර කොටස් ද මිලදී ගෙන තිබුණි. එසේ වුවද එම මෝටරය මුහුදු ජල සැපයුම් පද්ධතියෙන් ගලවා ඉවත් | බ්ලොක් - ඒ යන්ත්‍රාගාරයේ ක්‍රියාකාරීත්වය සඳහා මුහුදු ජලය ලබාගැනීමට මිලදී ගත් Submersible Solutions Pump අඛණ්ඩව පැය 24 පුරාම මුහුද රළු අවස්ථාවලදීද භාවිතා කිරීම නිසා අමතර කොටස් ගෙවියාම හේතුවෙන් අළුත්වැඩියා කිරීම් සිදුවිය. එම අළුත්වැඩියා කිරීමෙන් පසු එය | තාක්ෂණික නිලධාරියෙකුගෙන් සමන්විත සමීක්ෂණ මණ්ඩලයක නිර්දේශ මත සුදුසු කටයුතු කල යුතුය. |

කර 2025 ජුනි 12 වන දින වන විට නිශ්කාර්යව ගබඩාව තුළ රඳවා ගෙන තිබුණි.

භාවිතා කිරීමට ඉතා සුදුසු මට්ටමේ පවතී. එනමුත් Submersible Solutions Pump delivery line එක සම්පූර්ණයෙන්ම දිරාපත්වීම, මුහුදු පතුලෙහි Submersible පොම්පය සවිකරන brackets දිරාපත්ව පැවතීම හේතුවෙන් එය භාවිතයට ගැනීමට නොහැකිව ආරක්ෂිතව තබා ඇත.